# .උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
## (1987 අංක 50 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලද)
# පුරප්පාඩු

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. <u>ආරක්ෂක සහකාර III ශ්‍රේණිය - MA 1-2 - (පුරප්පාඩු 02)</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්:-**

**අධ්‍යාපන**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රිසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්.

I. ඉහත “අ“ සිට “ආ“ දක්වා ඇති සුදුසුකම් හෝ ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ වසර 05 ක සතුටුදායක සේවය හෝ රජයේ / පුද්ගලික ආයතනයක වසර 05 ක් සේවය කර තිබිය යුතුය.

II. ශාරීරික සුදුසුකම් පිරිමි - උස 5’ 2” පපුව 32"

ගැහැණු - උස 5’

**අභ්‍යන්තර අයදුම්කරුවන්:-**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත “ආ“, “ඇ“ සහ “ඉ“ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රිසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවු.05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :** අවු:18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** MA 1-2 - රු. 46,220/= 10x540 – 7x630 – 12x1, 080 – 12x1, 280 – 84,350/=

**ආරම්භක මූලික වැටුප -** රු 43,312/= (2026)

(මෙම වැටුප් පරිමාණය ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 1/2025 අනුව ඉදිරිපත් කර ඇති අතර මෙම පරිමාණයේ සඳහන් ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ)

**සටහන:** ආරක්ෂක සහකාර තනතුර සඳහා ත්‍රිවිධ හමුදාවල විශ්‍රාමික සේවා නියුක්තින් අයදුම් කරන්නේ නම් එම අයට ඔවුන්ගේ විශ්‍රාම වැටුපට ලැබෙන ජීවන වියදම් දීමනාව අඩු කර ඉතිරි මුදල පමණක් ආයතනය ජීවන වියදම් ලෙස ගෙවනු ලැබේ.මෙය කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රෙල්ඛ හා මූල්‍ය රෙගුලාසි මත පාලනය වනු ඇත.

## 2.රියැදුරු III ශ්‍රේණිය - PL 3 (පුරප්පාඩු 01)

**බාහිර අයදුම්කරුවන්:**

I) **අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

II) ප්‍රවීණතා

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බරවාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බරවාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබීම.

සහ

ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:** අවු:18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය:** PL 3 -රු.43,280/= 10x490 – 10x540 – 10x590 – 12x630 – 67,040/=

**ආරම්භක මූලික වැටුප -** රු.40,834/= (2026)

(මෙම වැටුප් පරිමාණය ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 1/2025 අනුව ඉදිරිපත් කර ඇති අතර මෙම පරිමාණයේ සඳහන් ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ)

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් රහිතය.ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකරණ මණ්ඩලය මඟින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඈ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දායකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුවන්ට වෛද්‍ය, හදිසි අනතුරු රක්ෂණ පහසුකම් යනාදි ප්‍රතිලාභ හිමිවේ.

ඊ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමඟ එවිය යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

උ. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්,අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසු වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, ලද අයදුම්පත් වලින් වැඩිම සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ඉහත තොරතුරු ඇතුළත් අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත් 2026.04.22 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

ප්‍රධාන විධායක නිලධාරී / මාර්ෂල්
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
තැ.පෙ.223,
අළුත්කඩේ,
කොළඹ 12.